# මා හද බිතුතල

# මායා හැඩතල



කතෘගේ නම :

දිල්රුකා චන්ද්‍රමෞලි ඇරෑගොඩ මිය

**කෘතියේ නම :** මා හද බිතුතල මායා හැඩතල

**කතෘගේ නම : දිල්රුකා වන්ද්‍රමෞලි ඇරැගොඩ**

**කතෘගේ වෙනත් කෘති :** අපේ රෝස බක්කි කරත්තේ **(2019)**

මායා ගුරු ප්‍රණාමයට සුදු අරලිය මල් දෝතක් **(2021)**

රවුමක් යමු මාත් එක්ක **(2023)**

**පරිගණක අක්ෂර සංයෝජනය :** රුවින්දි කාව්‍යා තිලකරත්න

**සහ පිට කවරය සැලසුම් කිරීම** තෙවන වසර

මානවශාස්ත්‍ර පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය

**කෘතිය පළ කරන දින : 2025.02.22**

**ISBN අංකය: 978-624-208-906-5**

# පිදුම

අසූව දශකයේදී

මහාමායාවේ

අට වසරේ සිඟිති දැරියක වූ මා හට

පොසොන් බැති ගී සරණියට

ගී ලියන්නට ඇරයුම් කළ

ලීලා නවරත්න සංගීත ගුරු මව්ට ~~~

ඒ ගී සප්ත ස්වරයෙන් වර්ණවත් කරමින්

මිහිරි ව ගැයුමට පුහුණු කළ

ඩබ්.විමලසිරි සහ නිමල් ආරියරත්න සංගීත ගුරු පියවරුන්ට ~~~

එදා  ඒ දැරිය වූ මා හට සහශ්‍රයේදී

මහාමායාවේ සහකාර විදුහල්පතිනියව

යළිත් විදු මව කරා පැමිණෙන්නටත්

පෙර දිගුව ගෙන යමින්

ගී ලියන්නට යළි වරම් දුන්

ශෂිකලා සේනාධීර වත්මන් විදුහල්පතිතුමියට  ~~~

පූජ්‍ය කරඳන අත්ථදස්සී මාහිමි සමරමින්

සොඳුරු මායාවේ අනූ තෙවන උපන්දින නිමිතිකොට

පුදමි මේ ගී කවි වන පස මලක් කොට

ඔබ සිව්දෙන පාමුළ

# පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධනය සහ වෙනස්වීම්වලට ගැළපෙන දැනුම අවබෝධය සහ සරල බුද්ධිමය හැකියාවන්ගේ සිට විමර්ශනශීලී චින්තනය නිර්මාණාත්මක කුසලතාවලින් සමෝධානික වූ ඉහළ බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වූ භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ. ඒ සඳහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍ය වෙයි.ඔහු තුළ මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හරහා සිදුකිරීම වඩාත් ඵලදායි වෙයි.

දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක් ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට මුල් වීම පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි.

මෙවර අප පාසලේ ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් දෙමින් තම සාහිත්‍ය නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් වීම ප්‍රශංසනීය කරුණකි. ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතු කිරීමක් බව මගේ හැඟීමයි.


**විදුහල්පතිනිය**

**ශශිකලා සේනාධීර**

**මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර**

# ඔබට කියන වග නම්....

අට තිස් වසක් ළපටි මල් කැකුලු හා වෙසෙන
විපුල බිජුවට තුළින් රුවන් අස්වනු නෙළන
යළි කිසිත් නොපතා ම තිළිණ කළ සිත් තොසින
මෙතෙක් ආ මඟ රසැති සැමරුම්ය සුවඳ දෙන....

දිරි දෙමින් පන්හිඳට සෙනෙහසින් ළඟ රැඳුණ
මා මැණි පියාණන් - සොයුරු සිව්දෙන මෙන් ම
ඉසි කෝ මන් දුරු ව අත දෙමින් සිප් පිදුව
උතුම් ගුරු දෙව්වරුන් - සිහි නැගෙයි නිරතුරුව

කඳුකරේ දුෂ්කරේ ගුරුතුමිය වූ දවස
කුලුණුබර පියෙකි විදුහල්පතිතුමත් සැමට
ගඟසිරිපුරදී මෙන් ම සෙංකඩගලදී බෝම
සරු අත්දැකුම් හිමිවුනේ පෙර පිනට සේම

මියුරු ගී මන නදන - සුබස රැඳි පැහැසරින
තක්සලා ගුරු වරම - කවි මලිනි එල දැරුව
පිපෙන සිසු කැකුලු මන - සරසවියගේ බැල්ම
සුපහන් ව දිදුලවන - අදිටනින් පුබුදමින
ජීවිතේ සදා
මහද පිළිසිඳි ආත්මීය වූ අකුරු කැල
නිරාමිස සොම්නසිනි පිදුවෙ දරු කැල වෙතට
සිප්හල් ද පුදබිම් ද ඇරයුම් කළෙන් නිබඳ
පුද දුනිමි මෙතින් ගී කවි - සැමට සිටි අයැද

බෝ කලක් රැඳුණු සීතාදේවි විදු අරණෙ
පිය තැබූ මුල් දින ම හැඳිනූ විදුහල්පතිතුමිය
සිලිලාරයක් ම විය - නම සුමනසිංහ විය
සසරෙ හුරු කල ලෙසිනි මගෙ කවිය දුටුවෙ ඇය

දරු හිතෙත් ගුරු හිතෙත් උපන් මුතු නෙළන්නට
සුරත දුන්නේ ළබැඳි සිතින්මය ඇය මෙමට
එදා අද තෙක් අපේ විදුහල්පතිනියන් සැවො ම
කළණ මිතු ගුරු කැල ද දිරි සවිය දුනි බෝම

නොවියැකෙන ලෙසින් රැක - මතු ද රැකෙනා විලස
එක්තැන් ව නිර්මාණ එකතුවක් - සදන මෙන
ලලනා ද ගයානි ද ප්‍රීනි චම්පා දම්මි
සොයුරියෝ සිහි කරමි සදා මා හද රැඳුණ....

ළපටි කල සංගීත ඇදුරුතුමි ඇරයුමෙන
මා ලියූ මුල් ම බැති ගීය මට අභිමි වන
ගෙවූ සතලිස් වසක අමිහිරි ම මතක ගැන
පැතුම වේ මෙබිම යළි පහත් දේ සිදු නොවන

එකල නොවුනා අකුරු පොත් මෙහෙම පළ කරන
එබැවින් ම දරුවාගේ නිර්මාණ අහිමි වන
අනුන්ගේ නිර්මාණයට තමන් නම යොදන
දුලබ ඒ දේ යළිත් නොවේවා කිසිම දින

මෙතෙක් ආ මඟ නිසංසල ව සැනසුම පිරුන
වග කියමි මා කිසිදු වැරැද්දක් නොකරමින
අත දීම පන්හිඳට ලැදි සැමට කළ ලෙසින
ඉසිඹු ලබනා දිනෙන් පසු ද දිවි කැප කරන

ජීවනේ සදා සෙවනැල්ල ලෙස ළඟ රැඳෙන
තුන්තිස් වසක් දිලෙන දිවි අරණෙ මිණි පහන
ප්‍රියලාල් මෙන් මහරු මුතුමිණි වූ දරු දෙදෙන
නිසා ලද්දෙමි මෙමා කලා ලොව රැඳෙන පින

මඩගොහොරු නොව සුපිපි පියුම් පැහැසර විඳිමි
අසෙනි කුසුමන් අසිරි - අසනි අකුණු ද දකිමි
විෂම විස ලොවක වුව - මහද සිසිලස රඳමි
බුදු දමින් ලෝ දුටුව පිනෙන් සැනසී නිවෙමි....

**සරණ දළදා සමිඳු පතමි සැමහට නිතින....**

# පටුන

01. සිරි දළදා - පුස්තක පූජා
02. වන පස මල් පුද....
03. පූජාච පූජනීයානං....
04. අවුරුද්ද
05. මලින් පිරුණු - පලින් නොඅඩු....
06. අනුබුදු හිමියනි....
07. නවෝදයක් බිහිවුණා....
08. නොලියූ දුක්කව....
09. බුද්ධං සරණං ගච්ඡාමි
10. වැලිවිට සරණංකර අනුස්මරණ ගීතය
11. අමිල දායාදය
12. ගුරු වන්දනා තුති කුසුම් ප්‍රණාම
13. ඇදුරු හරසර ප්‍රසාද ප්‍රණාම
14. වැව්තෙර ගිරිහිස - සැරදේ දම්රද
15.සීතාදේවි බාලිකා විදුහලේ 2013දී මුද්‍රිත වෙසක් පත් සඳහා රචිත කවි
16. ලොව්තුරු සුව සොයා....
17.මායා මාතා අභිවන්දන ගීතය
18. පිළිගැනිමේ ගීතය 2017 - අමරපුර මහා නිකායේ මහනායක හිමියන්ගේ පිළිගැනීමේ උළෙල
19. පිළිගැනිමේ ගීතය 2017 - ධර්මෝදය දහම් පාසැල - හන්තාන
20.පිළිගැනීමේ ගීතය - වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය (2022)
21.පිළිගැනීමේ ගීතය - වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය - (2023)
22. ලීලා නවරත්න ගුරුමවට උපහාරය
23."ගත්කරණී" පිළිගැනීමේ ගීතය - 2024
24."ගුරු ගෙදර" ග්‍රන්ථ කේන්ද්‍රය - ඇදුරු සිතක මහිම
25. දරුවනි....
26. පිනි වැස්සක් වී මව් නෙත....
27. පතිකුල පිවිසෙන දෝනිට....
28. කාන්දම්
29. මගේ මව්ට සෙනෙහසේ උවසර
30. මතක මංපෙත කෙටි ව ඔබ වෙත සෙනෙහසින්....

## 01. සිරි දළඳා - පුස්තක පූජා

අනේක රෝ බියෙන් වෙළෙන
සලිත අනිත හුස්ම හෙලන
සසර කතර අතරමං වූ
ලෝ දනගේ සුවය පතමි

අනුන් පෙලන නසන රිසින
රුදු වූ සිත් මුදු කරවන
බුදු වදනින් දිවි සනහන
පසන් සියුම් ලොවක් පතමි

මායා සරු සිප් සාරෙන්
පොහොණී ව පිපි සිත් කුසුමින්
සුගන්ධමත් බැති හැඟුමින්
දළඳාවට අකුරු පුදමි...

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

# 02. වන පස මල් පුද....

තොටිලි වැටෙන් පැන - සුවිසල් ඉමකට
පුළුල් මනැසකින් - ලෝ තතු දැකුමට
මතු දිවි ගිරි හිස තරණය කරනට
දිරි - සවි දුන් ආදර මව්පියනට...

නැණමල් විකසිත වන ඒ ගිරිහිස
සුසුවඳ ඇත සනසාලන දිවිපෙත
පරම දයාවෙන් එබව පසක් කළ
පහන් තරු ම වූ ගුරු දෙව්වරුනට

දිවිමඟ ගිරි දුර්ගය හමු වූ විට
අමිල සම සිතින් දුකසැප දරමින
සවිමත් අත්වැල වූ සුපසන්න ව
සංසාරික සහකරුවාණන් හට

ජීවනයේ පිරිපුන් බව හිමි කොට
සැබෑ සොඳුරු අත්දැකුමන් දුන් මට
ළපටි වියෙන් යෞවන එළිපත්තට
පියමං කළ පෙම්බර දෙගුරුන් හට

පුදමි සෙනෙහසින් - මෙය තිළිණය කොට....

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

## 03. පූජාව පූජනීයානං....

‘ප්‍රේමය’ අසෙනිය කුසුමක් වේ නම්
නොපතා කිසිවක් - කෙනෙකුට පිදෙනා
සව් සත හද රැඳි අඳුර දුරලනා
‘ගුරු බැති පෙම’ නොම වෙද වැඩි අගනා
කළල් දියෙන් නැගි - සුසුදු පියුම් සේ
ගුරු සිත් පිපුණා - සිසු මන පොබයා
දහම් පොතක් වී - අරුතින් රමණී
අදත් අපට ඔබ - නව පණ පොවනා
දිවි සරතැස - සිසිලසක් නිවනා
ඔබට පුදමි පිවිතුරු වූ අගනා
හදේ සුපිපි සුදු අරලිය මලිනා

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

# 04. අවුරුද්ද

රතු එරබදු මල් හිනැහෙනවා
කොහාගේ කට හඬ නද දෙනවා
රබන් ගහන හඬ පැතිරෙනවා
දැන් දැන් අවුරුදු ළඟ එනවා

චට පට චට පට ඩොං කියලා
රතිඤ්ඤා අලි ඩොං ඔන්චිල්ලා
පුංචි අපගේ සිත සතුටු වෙලා
කැවුම් කොකිස් කමු එකතු වෙලා

**පද රචනය - දිල්රුකා ඇරැගොඩ**

**1975 / 04 / 14 මිහිර පුවත්පතෙහි පලවූ මගේ ප්‍රථම නිර්මාණය.**
**(ගම්පොල ශාන්ත ජෝශප් බාලිකා විදුහලේ 3 වන ශ්‍රේණියේදී)**

## 05. මලින් පිරුණු - පලින් නොඅඩු

මලින් පිරුණු - පලින් නොඅඩු
සොඳුරු උදාවයි.....
සොඳුරු උදාවයි - සිරිලක
මිහිඳු මහිමයයි......//

පොසොන් දිනේ සුපුන් සඳේ
කැලුම් විදාලයි....//
සිසිල සදාලයි
මිහිඳු මහිමයයි......

මලින් පිරුණු.......

මිස්සක පව් වෙතින් නැගුණු
දහම් ගීතයයි.....//
සියොත් අසිරි චාමර මැද
දහම් ගඟ ගලයි...

**පද රචනය - දිල්රුකා ඇරැගොඩ**
**තනුව හා සංගීතය - ඩබ්. විමලසිරි මහතා**
**(සංගීතාචාර්ය මහාමායා බා.වි.)**

**(මහමායා බාලිකා විදුහලෙහි 8 ශ්‍රේණියේදී සංගීතාචාරිනි ලීලා නවරත්න මියගේ ඇරයුමෙන් 1980දී ම විසින් රචිතයි)**

# 06. අනුබුදු හිමියනි....

අනුබුදු හිමියනි ඔබේ මහිමයෙන්
නවෝදයක් බිහිවුනා
නවෝදයක් බිහිවුනා මේ දෙරණත
නවෝදයක් බිහිවුනා

සාගර පරදන නිල්වන් වැව්තල
අවුකන තොලුවිල සමාධි ප්‍රතිමා
අහස උසට නැගි රන්වැලි මහ සෑ
ඔබේ මහිමයෙනි බිහිවූයේ

අනුබුදු හිමියනි....

සීගිරි කැටපත් පවුරේ කුරුටු ගී
සිරිමා බෝපත් සැලෙනා හඬ මැද
සඳකඩ පහනක කැටයම් අතරින්
මැවේ ඔබේ රුව අනුබුදු හිමියනි

අනුබුදු හිමියනි....

රස කවි මතු කළ හෙළ සාහිත්‍යයයි
බොදු හඬ රැකදෙන ගී නාටකයයි
සැමදා පවතින සිහල උරුමයයි
හිමියනි ඔබහට සදා අප ණයයි

**පද රචනය - දිල්රුකා ඇරැගොඩ**

**(මහාමායා බාලිකා විද්‍යාලෙහි 9 ශ්‍රේණියේදී සංගීතාචාරිනි ලීලා නවරත්න මියගේ ඇරයුමෙන් 1981දී රචිතයි)**

## 07. නවෝදයක් බිහිවුණා....

නවෝදයක් බිහිවුණා - අමා දහම් ගඟ ගලා

දසරජ ධර්මෙන් රජ කළ නිරිඳුන්
හා වැසියන් දැහැමින් විසුවෝ
මිහිඳු අනුහසින් පිබිදුණු නව හිරු
කැළුම් විදා දෙරණත වැඩියා

නවෝදයක් බිහිවුණා....

කළුගල් තැලුනා බුදු රූ නෙළුනා
තෙලිතුඩු අතරින් සිතුවම් ඇඳුනා
දියරැළි නංවා මහවැව් තැනුනා
විමුක්තියේ රන් දොර ඇරුනා

නවෝදයක් බිහිවුණා....

දාගැබ් වෙහෙරෙන් ගතසිත නිවුනා
මෙත් සිලිලාරෙන් හදවත් තෙමුණා
සාහිත රතුකැට හෙලේ මතුවුණා
දහම් දිවයිනක් ලොවට ඇතිවුණා

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ**

**(මහාමායා බාලිකා විදුහලෙහි 9 ශ්‍රේණියේදී සංගීතාචාරිනි ලීලා නවරත්න මියගේ ඇරයුමෙන් 1981දී රචිතයි)**

**මායා සෙවණේදී බාහිර තරඟාවලියකින් ප්‍රථම වරට ජය ලැබූ ස්වයං නිර්මාණය**

## 08. නොලියූ දුක් කව

ඔබ මළ පසු - සොහොන් කොතේ

දුක් ගීයක් ලියන ලෙසින්

සඳු වියැකුණු-තරු නොදිලුණු

පාළු - මිලින රාත්‍රියක

ඔබ සැතපුණු සුසානයට

ආවෙමි මම - කිවිඳුනි මහගමසේකර

ඔබේ අළු බඳුන වන්-නෙතට නොම දසුන් විය

නිසල ඔබෙ සොහොන් කොත

කඳුලකින් බොඳවීය

ජීවිතේ කිසිදාක මා නොදුටු ඔබේ රුව

දුටුවෙ ඔබ සුසානයෙ - තණ පලස මතින් නොව

ඔබේ හිත් උල්පතේ ඉපිද දෙවුරේ ගැලුව

පුපුරු ගසනා සත්‍යය මත නැගුණු ඔබ දුටිමි

දෙනෝදාහක් දෙනා අතරේ

මහා යෝධයෙකු සේ

'ප්‍රබුද්ධ' ඔබ රුව පෙනේ මගෙ සිතට

**පද සංකල්පනය - දිල්රුකා ඇඹගොඩ (1984දී)**

**12-B (විද්‍යා අංශය)**

## 09. බුද්ධං සරණං ගච්ඡාමි

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි .......

සම්බුදුනි සුවහස් අසරණයින් හට
ඔබ දුන් සහසක් ඔවා මිණි
එදාට වැඩියෙන් අදයි වටින්නේ
සුගත තථාගත අනාථ නාථයිනි ....

බුද්ධං සරණං ගච්ඡාමී.....

යුද - ජල - ගිනි බිය අභියස සැලෙමින්
අනාථ මනු දම් දැවී නිවී ගොසිනි
ඔබ දම පමණක් කෙලෙසද නොසැලී
අකම්පිතව අද අනාථ නාථයිනි ...

බුද්ධං සරණං ගච්ඡාමී ...

කර්කශ ලොව තුළ රසාලිප්ත ස්වර
ඇසුවේ සුලලිත අමා දහම් ගීතෙන්
රුදුරු දසුන් මැද සොඳුරුම සිතුවම
මැවේ නිවුණු බුදුරුව දක්නා පමණින්

නිම් නැති ගමනක මුලාව දැක දැක
අනාථ වූ අප නිවාලන්න සමිඳේ
සනාතන දහම ඔරුවක් කර දී
මේ සසරින් අප මුදාලන්න සමිඳේ ...

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇඹේගොඩ මිය**

**තනුව - සංගීතාචාර්ය දයා බණ්ඩාර ඉලංගකෝන්**

**ගායනය - සීතාදේවී බාලිකා සිසු දියණියන්**

(2007 සමස්ත ලංකා ස්වර්ණවාහිනී අන්තර් පාඨශාලයීය වෙසක් බැති ගී තරඟාවලියෙන් 2වන ස්ථානය ලැබූ ගීතය ප්‍රවීණ ගීත රචක අජන්තා රණසිංහයින් විසින් මෙය හොඳම පදරචනය ලෙසද නම් කරන ලදී)

## 10. වැලිවිට ශ්‍රී සරණංකර හිමි අනුස්මරණ ගීතය

දළඳා සෙවනේ වැව්තෙර සිසිලේ
මහ සඟ රජ මාහිමි ගුණ කඳ රැව්දේ
අනුපමේය වූ යශෝ රාවයෙන්
සෙංකඩගලපුර ඇළලේ....

නිකසල දහමේ නිර්මල අනුහස පතුරා
දුශීල සමයේ අඳමිටු දම්සක් පරදා
ශීල ගුණෝපිත සත්‍යවාදී බව වපුරා
උදුල සඳකි පෑයූ බුදු සසුන සිසාරා

සහස් උපසපන් සඟ පරපුර දැය ගනඳුර දුරලන රන් පහනයි
පිරිවෙන් දම්පොත් බිහි වී සම්බුදු චිරස්ථිතිය අද සැදුනයි
සඟ සසුනේ නිසි පිළිවෙත් සැදූමෙන් සදා අනුස්මරණීයයි
සරණංකර සමිඳුන් සතු මහිමය අංජලිකරණීයයි

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**තනුව – දයා බණ්ඩාර ඉලංගකෝන් මහතා**
**ගායනය – සීතාදේවි බාලිකා සිසු දියණියන්**

**(ඒ.පී.ඩී. සුමනසිංහ විදුහල්පතිනියගේ ඇරයුමින් රචිතයි)**

**2007.08.02 දින මල්වතු විහාරස්ථානයේ පැවති වැලිවිට සරණංකර අනුස්මරණ උත්සවය සඳහා රචිත අනුස්මරණ ගීතය**

## 11. අමිල දායාදය

විසුළ පිණි මුතු මතට - ළහිරු රැස් උදා වී
සිහිති හසරැලින් මුව - විකසිත වූ උදෑසන
සීත වැව්තෙර හමන - පවනෙ රැඳි සිසිලසම
හදවතට තුරුලු කර - අත්වැල් බැඳන් එදා
නැවුම් හැඟුමන් සමඟ - පියනැගූ පා පොඩිති
හෙටද රොබරෝසියා පලස මත ඇදෙනු ඇති....
දිවයිනක වූ සතර ඉමේ සිට රොක් වෙලා
එක මවක දරු විලස සිප් කිරෙන් නැහැවිලා
ගුණ දහම් සඳක් සේ සිසු අඹර එළි කළා
ජීවනයේ සැබෑ සුන්දරත්වය හිමි කළා
සිසිල් පවනට සැලෙන කහ ඇසළ මල් වැලෙක
සුපිපි අරලිය මලෙක සුමුදු මුදු පෙති අතර
අප සුවඳ අතීතය - සැඟව ඉඟි බිඟි කරයි
අද හෙට ද මෙබිම මත - පිය තබන දියණියනි
එදා අප ළපටි විය - මෙදා පොඩි ඔබ සතුයි
සොම්නසින් ප්‍රමුදිතව - බොදු බැතින් නිකසලව
අද ගෙවන ඔබ දිවිය සදාකල් පිවිතුරුය
අතිර දේ ලොබ බඳින - මුදලටම වැඳ පුදන
සරුව පිත්තල ලොවම කසල බව දැන හැඳින
නිමල සුචරිතය රැකි - දිවියෙ හර කියාදෙන
සෙනෙහසින් ඔබ රකින - ගුරු මවත් ඇයම වෙයි
සොඳුරු විය හැර පියා - පා තබන කටුක ලොව
නොහැර යන සෙවනැල්ල - ඔබෙ දෙවැනි මව ඇයයි
සියල්ලෙහි අනිත බව - මැද මගෙහි උතුම් බව
මායාව පසක් කළ - සදාතන ධර්මයයි
නොසැලෙනා තිර මනස - චාම් බොදු දිවි පෙවෙත
දිවි පුරා ඔබ ලබන - අමිල දායාදයයි

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**(මහ/මහාමායා බාලිකා විද්‍යාලීය 75 වන වාර්ෂික සැමරුම වෙනුවෙන් නිකුත් වූ සඟරාවෙහි පළ වූ නිර්මාණය)**

## 12. ගුරු වන්දනා තුති කුසුම් ප්‍රණාම

'අ' යනු කියා ඔබ තුරුලට ආ දිනයේ
මට පෑ සෙනේ හෙට ජය ගැනුමට දිරිදේ
පිරිපුන් ගුණ නැණින් දිවි මග එකලූ කළේ
සක්විති වුනත් අප ඔබ හට ණය ගැති වේ

පුන් සිසි සදිසි සොමි ගුණ හදවත රැන්දූ
සුන්දර මදහසින් අප නෙත් මන බැන්දූ
කුළුණු ගුණෙන් සිසිලස අප වෙත කැන්දූ
ඔබමය අපේ දිවි ඔප කළ සුර ලන්දූ

පිය සෙනෙහසින් අප රැකි ගුරු පියාණෙනී
සාර සිප් සැදූ අප වෙත දයාවෙනී
මව්පිය දරුසේම අප බැඳි නිසාවෙනී
සසරේ යළිදූ හමුවේවා කළ පිනෙනී.........//

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**(පැන මඩ කඩිති ගීතයේ තාලයට)**

**(2012 දී ගුරු දිනය නිමිත්තෙන් මා සේවය කළ සීතාදේවී බාලිකා විදුහලේ ආරම්භයේ සිට 1980-2012 දක්වා සේවය කළ සියලු විදුහල්පතිනියන්, නියෝජ්‍ය විදුහල්පතිනියන්, සහකාර විදුහපතිනියන් හා ගුරු භවතුන්ගේ සේවය ඇගයීම උදෙසා පාසලේ ආදී ශිෂ්‍යා ඇරයුමෙන් රචිත ගුරු උපහාර ගීතය.)**

# 13. ඇදුරු හරසර ප්‍රසාද ප්‍රණාම

සදාදරණීය ඇදුරුතුමියනි....

මේ සුවිසල් ලෝ තුළ
යම් තැනෙක වේ නම් අප හද
ඒ ඔබ පෙන් වූ මං ඔස්සේ...
පියමං කළ නිසාමය...
වේ නම් යහගුණ අප තුළ
ඒ ඔබ අපට හිමි කර දුන්
අමිල වූ සාර සිප් දායාදයන්මය...
ඔබ වපුළ සරු බීජ එල දරා
අප හදවත් සුසුවඳ මල් සේ විකසිතය අද...
අවසරයි... ඒ කුසුම් කැන් පුදා
ඔබ පා නමැද...
දළඳා සමිඳු සරණින්
ඔබට නිරෝගී නිදුක් සුව පතන්නට
දයාබර සිතින් - සසරේ යළිඳු හමුවන්නට

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**(මහාමායා 1982 ආදි සිසුවියකගේ ඉල්ලීමක් සඳහා 2013දී රචිත ය)**

## 14. වැව්තෙර ගිරිහිස - සැරදේ දම්රද

අදිරද බැමි බිඳ - පෙන්වූ ඔදතෙද
වැව්තෙර ගිරිහිස සැරදේ දම්රද
දල්වන නිතියෙන් - බැතිපෙම් අපහද
ඔබමය ඔවදන අප දිවි සැදුමට
ඔබමය අභිමන අප හෙට දිනයට

ගල්මුල් බාධක මැඩගෙන දිවිමග
ජයට දිරිය ඔබ පෙන්වා නිසි මග
සුරු විරු දරුවන් බිහිව මෙබිම මත
මහරු මිණි ව ලොව දස අත බැබලින

රුසිරු දසුන් නෙත - පිනන ඉමකි මෙය
සොඳුරු සිතුම් නිති වපුල බිමකි මෙය
අසෙනි කුසුම් වී හෙට ඔබ පෙර මග
නමදිමු බැතියෙන් ඔබ පාමුල හිඳ

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**(දම්රදයේ 125 වන සංවත්සර සැමරුම සඳහා මපුතුගේ ඇරයුමෙන් රචිතය)**

## 15. සීතාදේවී බාලිකා විදුහලේ 2013 දී මුද්‍රිත වෙසක් පත් සඳහා රචිත කවි

**සම්බුදු මහිමෙන් - ලෝ නැහැවේවා!**

සරා සැකි කප් කලක් දස පාරමී පුරා
දරා නෙක දුක් ගැහැට මෝහ තිමිරය ඉරා
නුරාගික පුහු මනස විරාගෙන් තෙත් කරා
නිරාමිස සුව සැදී සසර සරනා තුරා

**බුදු මහිමෙන් - ලෝ නැහැවේවා!**

මනහරයි සිරිබරයි - සුපිපි වනමල් වදුල
සුන්දරයි පින්බරයි - මේ උදුල සඳ මඬල
නිර්මලයි පිවිතුරුයි - අමා දම් මුදු සිසිල
පහන් වී සොම්නසින් - නිවේවා සෝ තැවුල

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**චිත්‍ර - ගයනී කුමාරි රණතුංග මිය (චිත්‍ර ගුරුතුමිය)**

# 16. ලොව්තුරු සුව සොයා....

සඳ සිලිලාරයේ නැහැවී සිහිලැල්ලේ
බෝපත් මුදු සරින් සසැලේ පවනැල්ලේ
ඒ හා මසිත යාවී සුව සිතිවිල්ලේ
සුපහන් මෙත් සිතින් රඳුනෙමි සුදුවැල්ලේ

සම්බුදු රදුන් සතියක් මෙත් දහර විදා
අනිමිස ලෝචනය පුද කළ ගුණය
නිරාමිස සුවය සැදහැති සිතෙහි රඳා
සමාධියයි සැදුනේ බෝ සෙවනෙ සදා

කුලුණු දයාවකි සැම නෙතු දැලවරේ.....
බෝපත් අතර සඳ දියවර නිබදේ පෙරේ....
චමත්කාරයෙන් තුන්සිත පහන් කෙරේ....
ඉසිකෝ මතින් තොර ලොවකට දොරටු ඇරේ....

සැලෙනා පහන් සිළුවෙන් එළිය කෙරේයා
දැවෙනා සඳුන් සිහිලෙන් සිත නිවේවා
විකසිත කුසුම් සුවඳින් සිත පිරේයා
විසුරුණු සිත් සතන් එක් කෙරේයා

සුසුදු වතින් සැරසුණු උවැසියන්නේ
නිසල වතින් දැහැනට සම වදින්නේ
පිවිතුරු සිතිනි මේ පියවර නගන්නේ
සංහිඳියාව ලොව්තුරු සුව ගෙනෙන්නේ

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**(තලාතුඔය පල්ලේගම සූර්ය ප්‍රභා සාරිපුත්‍ර දහම් පාසලේ ප්‍රධානාචාර්ය හපුතලේ විමලධම්ම හිමිගේ ඇරයුමින් සූර්ය ප්‍රභා වාර්ෂික පුවත්පත වෙනුවෙන් රචිතයි)**

## 17. මායා මාතා අභිවන්දන ගීතය

වැව් තෙර විකසිත සුදු අරලිය අරණේ
පියගැට නැග ගිරි හිස මැයි තුරු සෙවණේ
ඔබ හා බැඳුනේ ගුරු බැති පෙමිනේ
සිප් නැණ සමගින් සරු යහ ගුණ සපුරා
දිවි මං තලයේ තිමිරය දුරු කරවා
දුන් ආලෝකේ ගුරු මව් ඔබවේ

කෙළිලොල් පාසල් විය නිමවීලා
කාලය ඉගිලීලා
මායා ගුරුමව්තුමියනි ඔබෙ වත
හද බිතු තල ඇඳිලා
ඔබ හා ආයේ හමු වී සෙනෙහෙන්
යලි හදවත් බැඳිලා
සුමියුරු සුන්දර පින්සර දිනයක්
අපටම තිළිණ වෙලා

දෙතිස් වසක් ගෙවුනද සමුගෙන ඔබගෙන්
එදා හැඟුම්මයි ඔබ ගැන සිත රැඳුනේ
අතීත සේයා සිහි වේ මායා
විදු මව් ගෙල කිතු මිණිමුතු බැඳී සැමගේ
පියවර නැඟුමට දුන් අතහිත ඔබගේ
අනුපම සේවේ වන්දනීය වේ

දල්වාලූ නැණ පහන් ලෝ පුරා
අද දසතම දිලෙනා
ඔබ සැම අභිමන් මෙහෙවර නිමවා
ඉසිඹු සුවය ලබනා
සොඳුරු අතීතේ මනරම් සැමරුම්
සිත තුල යළි මැවෙනා
සන්සුන් සුපසන් නිවුනු සිතින්
සදහම් පහසේ රැඳෙනා

උත්තම දළඳා ... සරණයි සැමදා ...
සසරේ සරණා... තුරු හමුවේවා ...///

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**(ගඟ අද්දර ගීතයේ තාලයට)**

**(2017දී 85 මායන්ස් කණ්ඩායම විසින් කළ ආදී මහාමායා ගුරු උපහාරය වෙනුවෙන් රචිතයි)**
**(මෙය යූ ටියුබ් මගින් 12,000ක් පමණ නරඹා ඇත)**

## **18.** අභිනවයෙන් පත්වන ලද උඩරට අමරපුර මහා නිකායේ මහනායක හිමියන්ගේ පිළිගැනීමේ උළෙල සඳහා වූ පිළිගැනීමේ ගීතය - 2017

මෙත් මුදිතා කුලුණින් ලෝ නැහැවූ - සම්බුද්ධානුභසින්
සැනසෙන පින් බිම සපැමිණි සැමටයි - මේ අසෙනිය කුසුමන්
වන්දනීය අභිනව ගරුතර මහනායක හිමිපාණන්
සපිරිවැරූ උත්තම සඟරුවනම පුදමු නමස්කාරෙන්

ස්වස්ති ශ්‍රී සුභ මස්තු.........

පින්සර දෑ කුල දෙව් පරපුර රන්දෙරණේ
දැල් වූ සදහම් ප්‍රඥා මිණිකැන් පහනේ
එළියෙන් පෙරමග දිදුලයි රට දැය සසුනේ
සව් සිත් පියුම් පිපේවා බුදු පුත් සෙවනේ......
සපැමිණි පින්බර ඔබ සැම පිළිගමු බැතිනේ....

ස්වස්ති ශ්‍රී සුභ මස්තු..........

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**තනුව හා සංගීතය - වජිර තුමුලවීර මහතා**
**(සංගීතාචාර්ය-සීතාදේවී බා.වි.)**

***(සුබෝධාරාමයේ පූජ්‍ය අස්සජී හිමියන්ගේ ඉල්ලීම පරිදි දායක සභාවේ අනුමැතියෙන් රචිතයි)***

# 19. වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය - 2017
# ධර්මෝදය දහම් පාසැල - හන්තාන
# පිළිගැනීමේ ගීතය

සුව සිහිලැල් පවනැලි - ගිම් නිවනා හන්තානේ
සිත් සතන් නිවන - ධර්මෝදය දම් අරණේ
හද අභිමන් රැඳි සව්සිප්සත ලැදි
පිරි නැණ ගුණ දම් - දිරි දරුවන් අපි
දම් මගේ සරමු - සරු එලම දරමු
ලක් මවුන් අරා - කිතු ගොස පතුරමු.....

ආලෝකය ලැබ දැල් වූ නැණ පහනින්
දස්කම් පෑ දම් පියසේ සිසු දරුවන්
නංවාලනු ඇත ඔබ අප හද අභිමන්
සපැමිණි ඔබ සැම පිළිගමු හද බැතියෙන්

ධර්මෝදය දම්සල දම් පවසට අමපැන්
උත්තම සඟ ගුරු දිදුලන සඳහම් මිණිකැන්
සැමදා බබළමු කඳුරට ඒ දම් පහනින්
වැජඹේවා ඔබ සැම සිරිසෙත් තුනුරුවනින්.

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**තනුව හා සංගීතය - ස්ටැන්ලි පී.කිරින්දගේ**
**(සංගීතාචාර්ය සීතාදේවී බා.වි.)**

**(එම විහාරස්ථානයේ ගරුතර ස්වාමීන් වහන්සේගේ ඇරයුමින් රචිතයි)**

## 20. පිළිගැනීමේ ගීතය

### *වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය* -2022

නිල් වැව්තෙර ගිරි හිස මනරම් මහමායාවේ
කිතු මුතුහර හෙළ බොදු කුල කත පැළඳුවේ
පබසර රන් මිණි පහනක සේයා සම වේ
සපුරන සිප් නැණ යහගුණයෙන් දිවි ඔපවත් වේ

තිළිණ ප්‍රදානෙට සපැමිණි සුපසන් සිතකින්
මහැදුරුතුමියනි සිප් සැදූ මායා පියසෙන්
ඔබ සැම පිළිගමු අසෙනිය කුසුමන් ඉසිමින්
දස්කම් ලියලන ලා සිත්යායට ළහිරු රැසක් මෙන්

සොඳුරු සිතුම් නිති වපුළ බිමේ
රුසිරු දසුන් නෙත පිනන ඉමේ
දිරි සවි අප හට ඔබෙන් පිදේ
ඔබෙ සෙනෙහස අප හදේ රැදේ

සිරි දළඳා සරණයි///
සැමට ම රැකවරණයි

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**තනුව හා සංගීතය- ශාන්ත ජයලත් තිසේරා මයා**
**(කටුගස්තොට අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යක්ෂක)**

## 21. පිළිගැනීමේ ගීතය

### *වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය* -2023

මායා මායා මායා මහාමායා

අප හද බිතුතල මායා හැඩතල
රූ සිත්තම් කළ විදුමව් සුළකළ

දිදුළන තරුමිණි අප ඔබගේ දියණියන්
සිප්නැණ යහගුණ සපුරාලන පිරිපුන්
තිළිණ ප්‍රදානෙට අමිල සොම්නසින්
සපැමිණි සැම පිළිගනිමු සෙනෙහසින්

සපැමිණි ඔබ සැම පිළිගමු සතුටින
සිරි දළඳා සරණින් පිළිගමු සිත් බැතියෙන්

මායා මායා මායා මහාමායා

චමත්කාර පේරාදෙණි සරසවි
සිත්හර බර දැකුමෙන් සුපහන් කළ
සරු සිප්විල මහාමායා
පිරි පියුමකි මනකල්
මහැදුරුතුමිය
අසිරි ලබා ගුරු දෙගුරුන්
සිතේ තබා දිරි සවි දුන්
විසුල ප්‍රභා මවන සොබා
තුමුල සභා නොම පසුබා//

මායා මායා මායා මහාමායා ///

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**තනුව හා සංගීතය- ශාන්ත ජයලත් තිසේරා මයා**

**(කටුගස්තොට අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යක්ෂක)**

## 22. ලීලා නවරත්න ඇදුරුතුමිය වෙනුවෙන් කළ උපහාර උළෙල 2024දී ගැයූ උපහාර ගීතය

දිදුළ සඳකි දුරු කළ තිමිරේ
මායා ගුරු අඹරේ
හසරැලින් මුදාලූ ඔබෙ සෙනෙහේ
ගීයකි මිහිරි සරේ
ඇහැළ අරලියා සුපිපි බිමේ
ඒ සත්සර රාවේ
එදා ගලාගිය අයුරු මැවේ

පොසොන් සඳේ මුදු කිරණ මැදින්
බැතියෙන් මන නඳනා
දැවෙන සිතට පිනි ඉසින ලෙසින්
මියැසි ගයා වැයුනා
සිසු දරු කුළුඳුල් ගී පබැඳුම්
පන්හිඳ අවධි වුණා
ගුරු මව්පියගේ ඒ මහිමේ
සදා හදේ රැඳුණා

මියුරු හැඟුම් හද බිතු තලයේ
ඔබ සිත්තම් කෙරුවා
නේක වර්ණයෙන් අප ඔප වී
ලොවට පියා සැලුවා
සිහිති කුසලතා විකසිත වී
සරසි සරණ ලැබිලා
නවරත්නයකී ගුරු මවුනි ඔබේ
අසිරියෙ මල් පිපිලා

නිදුක් නිරෝගී සුව වේවා
මහිමෙන් සිරි දළඳා
අපේ හදේ බැති පියුම් පිජේ
ඔබ සිහිවන සැමදා
සංසාරේ අප යන ගමනේ
ඔබ හා පිය මැනලා
භවෙන් භවේ අපි මේ ලෙස හමුවෙමු
සෙනේ දමින් බැඳිලා

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**(සඳක් බැස ගියා අවරගිරේ ගීයේ තාලයට)**

## 23. පිළිගැනීමේ ගීතය

## දිවිය දිනන විද්‍යුත් පොතක් උළෙල 2024

නිල්වැව් තෙර ගිරි හිස මනරම් මහමායාවේ
කිතු මුතුහර හෙළ බොදු කුල කත පැළඳුවේ
පබසර රන්මිණි පහනක සේයා සම වේ
සපුරන සිප් නැණ යහගුණයෙන් දිවි ඔපවත් වේ

තිළිණ ප්‍රදානෙට සපැමිණි සුපසන් සිතකින්
ඉසිවරතුමනී ලොවට ම දුන් සුව සැනසුම්
පන්හිඳ ඔසුවක් සේමය එහි නැත විමසුම්
ඔබ සැම පිළිගමු අසෙනිය කුසුමන් ඉසුමෙන්

දස්කම් ලියලන ලා සිත් යායට ළහිරු රැසක් මෙන්
සොඳුරු සිතුම් නිති වපුළ බිමේ
රුසිරු දසුන් නෙත පිනන ඉමේ
දිරි සවි අපහට ඔබෙන් ලැබේ
ඔබෙ සෙනෙහස අප හදේ රැඳේ

සිරි දළදා සරණයි
සැමට ම රැකවරණයි

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**තනුව - ශාන්ත ජයලත් තිසේරා මයා**

**(කටුගස්තොට අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යක්ෂක)**

**'ගුරු ගෙදර' ග්‍රන්ථ කේන්ද්‍රය මගින් පවත්වන ලද 2024 දීප ව්‍යාප්ත "සඳ දිය මංකඩ ඇදුරු ප්‍රතිභා" සාහිත්‍ය සම්මාන උළෙලේදී කාව්‍ය අංශයේ කුසලතා සඳහා ජයග්‍රහණය ලද නිර්මාණය**

## **24.** ඇදුරු සිතක මහිම

ගසක වැල් එතී සසැලෙන දසුන මනහරයි
ගසට උරුම සවිය වැලට නැති බවත් සැබැයි
දිනෙක වැලේ පිපි කුසුමෙන් තුරු හිස් සොඳුරුයි
දිරි දෙන ගුරුවරු තුරුමය සිසුන් වැල් සමයි

නාය යද්දි ගුණ නැණ තොර දරුවෙකුගේ මන
සාප නොකර මෙත් මුදිතාවෙන් වීරිය ගෙන
ඉමක් නොදැන සරුංගෝල විලසින් පාවෙන
දරුන්ට නිසි මග පෙන්වන ගුරුන්ය අපමණ

රුදු අව් ලෝ වනසන සඳ ගුරු හද සසලයි
නිසරු සිතුම් දුරැර නිමල දරු මල් සනසයි
ඉසි කෝ මන් තොර සිත සෙත් පිරිතකට සමයි
හිස අත හදවත සරු කොට දෙස පණ නංවයි

මවා ගිරග චන්දන සිසිලස පාරාදීසේ
නිවා තාප සෝ ළතැවුල් සරතැස සන්තානේ
රාව නැගේ මියුරු සකුණු මියැසි සේ ප්‍රභාතේ
පාව ඇදේ ඇදුරු තෙපුල් දරු හිත් මල් යායේ

දැයේ ඉටු දෙවිඳු විලසින් සදාකල් දිනේවා
රැයේ සඳු සේම තිමිරය සදා දුරු කෙරේවා
අඳුර දුරලනා අරුතින් ගුරු තරු බිහිවේවා
සසර පුරා සුවඳ සදන ගුරු සිත් පිබිදේවා

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

## 25. දරුවනි

පොතට සිතැති සිතක්
සිතින් රුවැති පොතක්
පිරුණු සිතත් වතත්
රන් මිණි වන් කමක්

නොවී වෙනත් අයෙක්
ඔබ ම වන්න ඔබත්
ඒ අදිටන් සිතත්
ලොවට ම සම්පතක්

ලොවෙන් සොයන යමක්
ඔබ තුළින් ම ලබන්
එම දිනයේ සිටන්
ඔබ පෝසත් සිතින්....

**පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

## 26. පිනි වැස්සක් වී මව් නෙත

පිනි වැස්සක් වී මව් නෙත මුතු කඳුලු
පින් සුවඳක් දී මුව හස මල් කැකුලු
ඒ මුතු පින්නේ මා තෙමුණා
මා හද දයාවෙන් මුදු කරනා
රහස ඔබ ම බව දැනුනා අම්මේ
ජීවිතයේ රස හඳුනා...

මව් සුලැඟිලි පහස පවා
සෙනේ තරංගයක් මවා
පිය තෙපුලක චමත්කාරයේ
අරුත රුවා
සියුමැලි වත-යෝධ බල සිත
සඟවා....
විසල් ලොවක් රුහිරු කිරෙන්
නුඹ සොඳුරු කළා

විඳි වේදනා සයුරට තුටු කඳුලු පා කළා
දිගු කළා ද නුඹෙ සසර ම මොළකැටි මුල් හැඬුම්
වැව් තලයක ගඟුලැල්ලක නැඟෙන රළ මත නොබිඳෙන
නොතෙමී දිදුලන-රන් සඳ නුඹෙ මුහුණ

පිනි වැස්සක් වී....

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**තනුව - වානක තෙන්නකෝන් මහතා**
**(චන්ද්‍රානන්ද විදුහලේ සංගීතාචාර්ය)**
**ගැයුම - නදුන් නිම්සර නිශ්ශංක**
**(10 වසර ශිෂ්‍ය)**

**(1200 views on YouTube, 114 likes & 94 comments)**

❖ **මහාමායා බාලිකා විදුහලේ ආචාර්යය මණ්ඩලයේ ක්‍රිෂාන්ති ජයවර්ධන ගුරු සොයුරියගේ ඇරයුමින් රචිත ය.**

# 27. කාන්දම්

කෝටු කැබලි කොල තුඩගින්
රැගෙන තැනූ රුවල් ඔරුවෙ
කුඹී පැංච කුකුල් පැටිය
සතුටින් සමගියෙන් එක් ව
තරණය කර දිය පාරකි...

කඳු හෙල්වැටි පසු කර විත්
ලොකු බිරියෝසා ගස යට
මොහොතක් නැවතී හෙමිහිට
විඩා හරින තැපැල් මාමා
ගමේ සැමට බෙදූ සතුටකි...

වනන්තරේ සැරින් සැරේ
වැහිපොද එනකොට හතු යට
මිතුරු පිරිස තුටින් නටති
ගස් බෙනයක පුංචි ගෙයකි
සුව පහසු ව පැටව් නිදති...

හැම වස්සානෙ ම ඒ පොත්
මතකය දිව යයි තවමත්
ලස්සන වසිලිස්සා දුටු
බාබායිගා යකිනියකට
අපූරු හත් පෙති මලකට

ළපටි සිතක් පෝසත් කළ
සිහිනි විය ම රසවත් කළ
අන්දර නිහඬ ව නිසල ව
මියෙන තුරා හිතේ රැඳී
මිහිරි සිතුම් මට හිමි කළ

**පද සංකල්පනය - දිල්රුකා ඇරගොඩ මිය**
**(2024දී රචිතයි)**

## 28. පතිකුල පිවිසෙන දෝනිට....

පිනි හිනැහෙන උයනෙ පිපුණ රෝස සමන් නෙලා රැගෙන
වැව රවුමේ ඔබ පෙර දින මව් සුරතේ දැවටී ගෙන
නිරන්තරේ පිය නගමින් දළඳා සමිඳුන් පිදූ හැටි
සොඳුරු සිත්තමක් සේ ඇඳුනා මා මනසේ අම්මේ...

මැදින් පෝය සඳ සිසිලස ගලා හැලෙන සඳළුතලේ
ඔබට මව් කියූ වදන ම අද මට කොඳුරයි මඳනල
යළිදු මැදින් සඳ පුදින දිනේ කුලගෙයට පිවිසෙන
මොහොත උදාවන බව දැන වියෝ ගිනි සිතේ ඇවිලින

බුදුවුන පෙර බෝසතුන්ට දූවරු හිමි වී සිටියත්
බුදුවුන භව ගිහි කළ දූවරු නම් හිමි නෑ
දුව හැර යන අබිනික්මන හිතට පහසු නෑ
අම්මේ සිත නිවා ගන්න ඔබට පහසු නෑ

මව්පිය නෙත් නෙතු දැක සමුදෙන දින දුර නෑ
පෙරුම් දම් පිරුවත් අපි යළි සසරේ හමුවන්නට
බැඳුම් යදම් බව දත් ඔබ නිවන් මඟේ සුවය සොයන
පාරමිතා මඟ පිවිසෙන දිනය දුරත් නෑ

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**

**(පාසලේ සමකාලීන සොයුරියක වූ සඳමාලි බාලසූරිය සොයුරියගේ ඉල්ලීමට අනුව 2025 මාර්තු මස සිදුවන ඇයගේ දියණියගේ විවාහය නිමිත්තෙන් රචිත ය)**

## 29. මගේ මව්ට සෙනෙහසේ උවසර

සිත පිරිපුන් අත් පොතක් වගේ
වත සිසිකැන් මුදු සිරිය රුඳේ
නෙත දැහැඳුල් සෙනෙහසයි හඳේ
අරුත විසල් දිවි පහනේ ඇගේ

තුඟු ගිරි හිස පවනැල්ලේ
සුව සිසිලස විඳිමින්
පැහැසර අරුණක විකසිත කුසුමකි මගේ මවුන්

සුපසන් මනසින් දරු කැලකට දී සරු දැකුමන්
එඩිතර නිරවුල් ගුරු තරු මිණමය අභිමන්

සීත සඳුන් අරටු විලස
සිඳිත මඩිත සුවඳ විඳිත
පිළිවෙත් සරු පරපුරකට
ඔසු පැන් කලසක් විය
ඔබෙ ගුණ අම්මේ

නැණ මිණි මුතු සහසක්
ලෝ වෙත පිදුවා
ඒ මුතු පෙළහර සිරිසර
ඔබ දුටුවා

දිවිසල රුව රන් දියවර
සේ ගැලුවා
නිසංසලේ සැන්දෑ
ඉසිඹුව ලැබුවා //

සිත පිරිපුන්......

**ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය**
**තනුව හා සංගීතය - රොක්සාමි මයා සහ ඇන්තනි සුරේන්ද්‍ර මයා**

**(මගේ මවගේ 80 වැනි උපන්දිනය නිමිත්තෙන් මා ලියා මගේ මල්ලි කළණ ඇරැගොඩ විසින් ගැයුවකි)**

# 30. මතක මංපෙත කෙටිව ඔබ වෙත සෙනෙහසින් .......

අතීතයේ සොඳුරු දිනෙක චූටි කාලෙ
අයියා - මල්ලි මා එක්කල අප්පච්චී
වැව රවුමේ කාර් රේස් නරඹන්නට නුවර ඇවිත්
වැව් ඉවුරේ කඳු බෑවුමෙ ඉන්නා අතරේ
මල්වැට අද්දරින් පෙණුනු පාසලකට අත දිගුකර
"ආන්න දුව ඔයා කවද හරි යන ඒ ඉස්කෝලේ! "
කියල පෙන්නුවා මතකයි හීනෙන් ගෑ සුවඳක් සේ
සිහිති හිතට පැතුමක් දී....

ඉතින් කාලෙ ගතවීලා - ශිෂ්‍යත්වෙන් සමත් වෙලා
මගේ මුල්ම පාසල වූ - සෙන්ට් ජෝෂප් බාලිකාවෙ
සැමගෙන් සමුගෙන - ගම්පොල සිට මායාවට ආවේ
ජයනි - සමුද්‍රා සමඟින් පාසල් බස් රියෙ සතුටින්....

අදිකාරම් ගුරු මවගේ 6 A ඉතිරෙන විටදී
මීගම්මන ගුරු මවගේ 6 D හැඳුණා අපටම
'ශ්‍රවණාගාරේ තැන' අපෙ හයේ පන්ති ටික තිබුණේ
සංගීතේ හැදෑරුවත් සුන්දර සිත්තම් විඳින්න
ආට් ටීචගේ පන්තියෙ දැලෙත් එල්ලුණා හැමෝම

දුඹුරු දාස්පෙතියා මල් පිපිලා තිබුණා මිදුලේ
ගණන්වලට ලකුණු අඩු ව දුකින් ඉන්න විට ලක්මිණි
"ඒයි ලකුණු පෙන්නන්නේ කොහොමද අපි ගෙදර ගිහිං?
අපි දෙන්නා අර මල් කාලා මැරෙමුද? ඒවා වස!
"බෑ අප්පා අපරාදෙනෙ ගණන් හින්ද ඇයි මැරෙන්නේ?
අනිත් වැඩට හොඳට ලකුණු තියෙනවානෙ මේ බලන්න"

ඔන්න අපේ බොළඳ වියේ රස මුසු වුණු ළාමක බව
සිනාගෙනෙන ඒ වග දැන් ලක්මිණීට අමතකමුත්
ඒ මල් අනුභව කෙරුමට නිල්මිණීටත් සිත් වූ වග
දෙතිස් වසක් ගෙවා ළඟදී එංගලන්තෙ ඉඳල ආපු
ලංකානිට මතකයිලුනෙ හරිම පුදුම ඒක නේද?

උදෙන්ම සවනත විදුහල්පතිනිගෙ ගැඹුරැති දම්පද
අප ව හැඩගැසූ ලලිතා ප්‍රනාන්දු මැතිනිගෙ ගුණකඳ!
වන්සේකර මව කරුණාරත්න මවත් කරුණාබර
අපගේ ගුරු මව් පියවරු වී නැත පොඩි අප හට දුර....

පන්තියකින් පන්තියකට නිකරුනේ ම සමත් නොවී
පුංචි අත්දැකුම් සැමරුම් ඉගෙනුම හා බැඳී තිබිණ
අද දිනයෙත් මා සිසු පරපුර ඇසුරේ රැඳෙනා කල
අප ආ මග සිහි කැඳවයි ඒ මායා හැඩ රූ තල
කුලුණු ගුණේ උල්පත වූ රණවාරණ ගුරු මව් මුව
රැඳුණු සිහල බස රසවිඳ ගැදි පැදි රචනෙට ලොල් වී
හැම වසරෙ ම සිහල බසට මුල් තැග්ග හිමි විය මට

සතියේ හැම සිකුරාද ම සමිති වාර හැම එකට ම
"නාට්ටියක් "අටවාගෙන අනේ අපට තිබුණු ගාය
රඟ දක්වල පෙන්වන තුරු අපි ම ලියපු අත්පිටපත්
චූටි ජයතිලක ටීචයි සුසිරි සිරිවර්ධන ටීචයි
සියලු අපේ ගුරුතුමියන් විවේචනය කරන විටදී
පුංචි අපේ රැඟුමන් දැක ආඩම්බර සතුටක් විය
ප්‍රියංවදා "සිංහබාහු" අපි ඇල්ලුව කෝරස් එක
"නව නළු රස "නව දෙනෙකුගෙ
මා වාදකයෙකු වූයෙමි
සාකච්ඡා තිම්පුවෙ තිබූ උදේනිලා මල්ජි සමග
කාන්ති යුද්ධයටම ලැදි වී හරබර විය රැඟුම ම
අචලා රවුන්ඩස් ;ගැහුවා පිට්ටනියේ බොහෝ විට ම
පුනායා පොත් කියවූවා ශක්ති සමග බර බරේට

මේ කාලෙදි විද්‍යාවට පරිසර දින පොත් ලිව්වේ
පැෂන් වැලක බට්ටිච්චි කූඩුවක චිත්ති මං දුටුවේ
පොඩි මැණිකෙ ගුරුතුමියට මා ලිව් තතු හිත වැටුනේ
හැම බදාදා මා රැගෙන ම ඇය 'විද්‍යාභිවර්ධනේ'
පේරදෙණිය සරසවියේ වෛද්‍ය පීඨයේ තිබුණු
පාසල් සිසුනගෙ වාර්තා අතර මගෙ 'කුහුඹු පුවත්'
'GOOD WRITER' කියමින්
නිති මහැදුරු බස්නායකයන්
පැසසූ විට තුටු වූයෙමි ගුරු මව හා අභිංසකව

තවත් දිනක 8 වසරෙදි සංගීතය පාඩමේදි
මගේ කවියක් මිහිර පතෙහි දුටු ලීලා නවරත් මව
එවර පොසොන් බැති ගීයක් ලියනා ලෙස පැවසූ දිනේ
මට නව ලොව විවර වුණේ ඒ දුන් අත පුංචි කාලෙ
අද දවසෙත් තදින් වෙලේ ඇගෙ සිසුවියො මගෙත් නිසා
ඇත මිහිරි යුගයක් වෙත මගෙ සිතුවිලි යළි පාවේ
සඳකැන් පිනි දිය ගලනා පොසොන් දිනේ නිශා යාමේ
සඳුන් කපුරු සුවඳ මැදින් පහන් වැටක් එළිය වුණේ

එළිමහනේ වේදිකාවේ ගැයුවෙමු බැති ගීත නිතින්
මල්කාන්ති ලිලන්ති අක්කා මියුරුව ගී ගැයුවා
තනුජා අක්කා නිරතුරු සිතාරෙ තත් හැඬවූවා
සංගීතය ගුරුතුමා ද කිව් ලෙස බැති ගී ලිව්වෙමි
ඔහුගේ ස්වර තනු හැඩ කළ මගෙ ගීත ද අපි ගැයුවෙමු
'මේ බටු ඇට කෙල්ල හපන්! ' ඔහු නිතර ම පැවසූ විට
මා සිතුවේ මිටි බංකුව මත මිටි මා නැගී නිතර
බැති ගී ගැයූ හින්දා තමයි එසේ කියන්නේ කියලා
ගීත පුහුණු වී හැමදා වැවරවුමේ දෙපිය නගා
මුමුණ මුමුණ බැති ගීත ම හුදකලාව මා ගිය හැටි
අදත් වැවරවුමේ යන විට මගෙ මතකෙට පිවිසෙනවා
නෙත කඳුලින් බරවෙනවා අතීත සුවඳට නතු වී
අම්මයි අප්පච්චියි ආ දිනකදි බැති ගී අහන්න
මගේ නමින් තුති පිදුණා පොඩි හිත සතුටින් පිපුණා
සිහිති දැරියකට මායා මවුන් වුණා තෝතැන්නක්
ණයගැති වෙමි එදා එසේ පිරිනැමූ මහ පන්නරයට
මෙහෙම කාලේ ගත වන විට ගණන් බැරි වුණත් මා හට
අලුත්ගමගෙ ටීචර් ගණන් උගන්වන විටකදි
'මොකද අනිත් වැඩට තැගි ගන්නවනම් ගණන් බැරිද?'
ප්‍රමේයයක් මට වැරදී "උඩ 9 යේ පංතියේ සිට
පහළ ජේන 8 වසරට අත අරිනවා මං උස්සලා"
සැර කළ දා ඇගෙ සාරිය තාමත් මතකයි මා හට
සහවාගත් කරුණාවකි යොමුකලේ ඈ කුඩා අපට
පසුකාලෙක ඒ ගුරු මව මගේ දියණිය ළදරු කාලේ
මාහට සේවය කෙරුමට පහසු පාසලක් ලැබුමට
කළ උදව්ව මතකයි මට තාමත් අද එදා මෙන්ම
අද සයුරින් ඈතක සිටිය ද මේ තුති මව්නි ඔබට
කෙස් රොදවත් අවුල් නොවූ වයිසුන්දර මව්ද තව ද
ගුණසේකර - කුමාරි - මාලනි - හේරත් ගුරු මව්වරු
මොණරාගල - බුලංකුලම - තැම්ණිමුල්ල - රත්පටබැඳි
කුලතුඟ - නුගවෙල - පෙතියාගොඩ - ඇල්ලේපොළ මව්වරු
කරලුවින්න - ගුණවර්ධන - ගුණරත් අප ගුරු මව්වරු
කෙළි රජින වූ මානෙල් මව් වීනෙන් ආ වුන්ච් ටීචර්
නිමල් ආරියරත්න - විමලසිරි මියැසිය දුන් පියවරු
රාජපක්ෂ මව්ගෙනි ලී කෙළි හරඹෙත් කුලුනැටුමත්
ELOCUTION මුලින් දුන්නේ අබේකෝන් මව් විය
COUNTRY DANCE කියල දෙමින්
පියානෝවෙ රඳුනෙ තුටින්
අමරසේකර මවුන් ය

රූප කපා හැඩ කළ ක්ෂේත්‍ර පොත සිතියම
පුංචි වියේ අපගෙ ජීවිත හැඩ කළ හැටි මතකයි
අබේවික්‍රම් ටීචර් දිනක් සොබාදහම් සිසු හවුලක්
ඇරඹූ විට මුල් ම පිරිස ලෙසට අපිත් එකතු වුණා
දිනෙන් දින ම නව තුරු වැල් මායා බිම පුබුදු කළා
අයිරාංගනී සේරසිංහ මැතිනි දිනක් එහි ආවා
විද්‍යා පන්තියෙදි අබේවික්‍රම් ටීචර්ගේ මිහිරි බැනුම්
ඇසුමට මංදා මං ඇයි ඒතරම් ම කැමති වුනේ
කිරිපැණි පළතුරු සලාද හිමකිරමත් කාටත් නැති
මහාමායාවට පමණක් තිබෙනා රසවත් දේ නිති
වෙන පාසැල්වල නැති සැප ගැන කිව්වේ ඒ ලෙසටයි
අපේ උනන්දුව මදි විට ජප මන්තරයක් විලසට
ඇය අදටත් F.B .හිඳ අපිට පහන් තරුවක් වෙයි
අනේ ඇත්තටම මේවා සසරේ බැඳුම් කියා සිතෙයි!
හේලීගේ වල්ගා තරුවත් නැරඹුවේ රෑ කඳවුර තුළ
සුදු රෙද්දක් ඇඳ හොස්ටල් දෙසින් හොල්මනක් විලසින්
ඇවිදින රුව අපි බැලුවම එතුළ සිටියේ අපේ නිල්මිණී!
රස විඳ විඳ අයිස් ක්‍රීම් රු 12 ට අනේ අපොයි!
ලලනි චන්ද්‍රිකා මල්ලිකා චම්පි කලානිලා සමඟින්
ගී රස විඳි යුගයකි එය තැනක් වෙලාවක් නැති ලෙස
ගහවැරැල්ල වැට අද්දර පියගැටපෙළ මත ඉඳගෙන
අමරදේවට ප්‍රිය කරමින් බාල ගීත අත හරිමින්
ළමා වියෙන් යොවුන් වියට එබිකම් කළ හැටි මතකයි
මඩොල්දූව හඳයා ගඟ අද්දර හා ගැහැණු ළමයි
රෙබෙකා - මයි ෆෙයා ලේඩි හා සිතුවිලි බැඳී තිබිණ
පුස්තකාලේ පොත් පිටු තුළ මට සේකරයන් හමු විය
'නිමක් නොමැති කොටාරමකි - ළමා වියේ ආස්වාදෙ '
එලෙස කිව් කේ. ජයතිලකයන් ද මායාවට පැමිණියේය
ඔහුගේ මහඟු පොත් රැගෙනම
දිනක් සුසිරි ගුරු මව් හුදකලාවේ බංකුවේ ඉඳගෙන
සිටින විටක දිව ගියේ අප උසස් පෙළට පිවිසි අලුත
"හරියට වැඩ අපට අනේ ලියන්නවත් නෑ වෙලාව
ගීත කවි ද කෙටි කතා ද මට නම් දැන් අනේ ටීචර්"
මා පැවසූ පසු ඇ දුන් පිළිතුර මතකයි තාමත්
'ඔයා අහල තියෙනවාද - අමරසේකරව ගුණදස්? "
'ඔව් ඔව් පොත් ලියන හොඳට මහැදුරු වෙදතුමානෙ ඒ '
'ඉතින් දරුවො දත් ගලවා ගලවා හිටියොත් හැමදම
එතුමා ලිව් ලස්සන පොත් ලියන්නෙ කවදද කොහොමද?'
ඒ මගෙ හැරවුම් ලක්ෂෙකි ගුරුතුමියනි ඔබගේ හඬ!

පාසැල් බස් රියේ හිටිය මගේ පාඨක අක්කලාට
මිල මුදලින් බැහැ මනින්න අපමණ වූ රස සැමරුම්
අවසන් වසරෙදි පාසැල් යුගයේ මිතුරියො කී ලෙස
ගැයූ ගීයක වූයේ 'අප මින් මතු නැත හමුවන්නේ' ලෙස
ඉකිබිඳිමින් ඒ ඇසුනම නිල්මිණි හැඬූ හැටි මා දැක
පසු දිනකදි දැන ගත්තෙමි කුමටද එතරම් ඇගෙ දුක
'යළි කවදාවත් නිල ඇඳුමෙන් මේ මායා බිම තුළ
අප මින් මතු හමු නොත්වනා බව සිහි වී මට හැඬුණා'
ප්‍රියයන්ගෙන් වෙන්වීමත් අප්‍රියයන්ගෙ එක්වීමත්
බුදු වදනේ සත්‍යය දැන් වැටහෙයි පරිණත අපහට......
ඉහළින් සා.පෙළ සමත් ව උසස් පෙළට පියමං කර
උද්භිද භෞතික විද්‍යා සත්ව රසායන විද්‍යා
තෝරාගෙන නව තෙමහල විවෘත කළ දින තිබුණේ
අප දැතින් නිමැවුම් කළ ඒ විද්‍යා ප්‍රදර්ශනේ
ලීලානන්ද - වික්‍රමසිංහ - සෙල්වරත්නම් ගුරු මව්වරු
නානායක්කාර මවුන් ඒ විෂයන් ඉගැන්වූයේ
අංශය භාර ව නාරම්පනාව ගුරු මව් හිටියේ
බඳුගේ - සිරිවීර - චිත්‍රමාලා - භාරතී මව්වරු
මෙන් ම සුමනසේකර මව්වරු දෙපලකි විදුබිම සිටි
රත්නතිලක නම් සමරසිංහ ගුරු මව්වරු ශිල්ප සැදූ
ජයවර්ධන - බෝකලමුල්ල ගුරු මව්වරු ඒ කාලේ
විවිධ දිශානති දෙස පාසලෙන් පසු ව යොමු වූ අප
වසර දෙතිස නික්මී අද හමු වූයෙමු මේ ලෙස යළි
"මහමායා අභිවන්දන" විලසින් ගුරු පා පුදන්න

රොබරෝසි පලස මත - අරලියා වදුලු යට
නිම නොවූ පිය තෙපුල් - අද ද දොඩමළු වෙලා
දුලබ ගුණ හද රැඳුණු - සොඳුරු මිතුරියො රැන
අතර පෙරමුණ යසස්ශ්‍රී නොවී නම් අපට
නැත අපට මිතුරු හමු - මේ තරම් පිළිවෙලට
දයානිත් - සුනේත්‍රා - නිමාලිත් - මල්ජිනීද
මංජු - මල්කිත් - ප්‍රියංවදා - ප්‍රීති සිට එරට
තව නොකී නමින් යුතු - ''මැණික් මායාවියන්''
ශ්‍රමයෙන් ද ධනයෙන් ද වෙහෙස වී කැපවෙමින්
උදා කළ අද දිනෙත් - අප දිවිය සුවඳ විය!!!

**මතක සැමරුම - දිල්රුකා ඇරැගොඩ මිය**



දිල්රුකා චන්ද්‍රමෞලි ඇරෑගොඩ
සහකාර විදුහල්පතිනිය *(ශ්‍රී.ලං.වි.සේ.1)*
***(BA, Bed, PGDEM, Eng. Trained)***
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

# පසුවදන

රටක අනාගතය සඳහා මානව සම්පත සූදානම් කිරීමේ වගකීම පැවැරී ඇත්තේ ගුරුවරයාට ය. එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශයෙන් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් පසු වීම වැදගත් ය. ඔවුන් සමාජයේ පෙරගමන්කරුවන් නිසා ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යාවත්කාලීන වීම ද දරුවන්ගේ පරමාදර්ශී චරිතයක් වීම ද අත්‍යවශ්‍ය වෙයි. තමා වෙත පැවරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ සමාජ වගකීමයි.

මෙම යථාර්ථ පසක් කොට ගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොට ගත් දරුවන් දහස් ගණනක් දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කතු අංකුර ලෙසින් රෝපණය කරන්නක් විය. ඊට සමගාමී ව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන් ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ වෘත්තිකයන්ට තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ද වේදිකාවක් සකසාදීමට ලැබීම භාග්‍යයකි. මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සමඟ පොත් ලියන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන් ම ගුරුවරුන්ට ද ආදර්ශයකි. ඔබගේ නිර්මාණ දිවිය සඵල වන්නට සුභ පැතුම්.

**හෙරණගත්කරණී නිර්මාතෘ**
**සෙනෙවිරත්න මහලේකම්**
**2025.02.08**

**ISBN අංකය: 978-624-208-906-5**